# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## නේවාසිකාගාර සඳහා සුදුසු නිවාස කුලියට ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් හට නේවාසික පහසුකම් සැපයීම සඳහා සුදුසු නිවාස කුලියට ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් අයදුම්පත් කැඳවේ.

මේ සඳහා පහත අවම සුදුසුකම් ඇති ගොඩනැගිලි හිමිකරුවන්ට අයදුම්පත් යොමු කළ හැකිය.

- කුලියට ලබා දෙන නිවස විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පිවිසුමේ සිට කිලෝමීටර් 10 ක් ඇතුළත පිහිටා තිබීම
- අවම වශයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 30 කටවත් නේවාසික පහසුකම් සැපයිය හැකි වීම
- ජලය, විදුලිය හා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් පැවතීම
- බදුල්ල, කොළඹ ප්‍රධාන මාර්ගයට ආසන්නව පිහිටීම
- අවදානම් විදුලි රැහැන්/ ගිලා බසින වළවල් හා වෙනත් ස්වාභාවික උවදුරු ආදියෙන් තොර වීම
- සිය නිවස හා ඉඩම පිළිබඳව නිරවුල් හිමිකමක් පැවතීම

සිය නිවාස විශ්වවිද්‍යාලය වෙත කුලියට දීමට අදහස් කරන අයදුම්කරුවන්, මේ සමග ඇති ආකෘතියට අනුව අයදුම්පතක් සම්පූර්ණ කර, ඉඩමේ ඔප්පුවේ සහතික කළ පිටපතක්, අදාල ස්ථානයට පිවිසීමේ දළ සිතියමක් හා අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපතක් සමග ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන හා ශිෂ්‍ය සේවා, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ. 02, බෙලිහුල්ඔය යන ලිපිනයට 2026. 02. 06 දින ප.ව. 4.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ භාර දිය යුතුයි.

2025. 02. 09 දින ප.ව. 2.30 ට එම ලංසු අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේහිදී විවෘත කිරීමට නියමිත අතර එම අවස්ථාවට ලංසුකරුට/ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැක.

මේ පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වන අතර, ප්‍රසම්පාදනයේ කිසිඳු අදියරක් සඳහා විශ්වවිද්‍යාලයේහි කිසිඳු නිලධාරියෙකුට බලපෑම් එල්ල කිරීම සපුරා තහනම් වේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
තැ. පෙ. 02, බෙලිහුල්ඔය - 70146
2026. 01. 23

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# විශ්වවිද්‍යාලයේ සිසුන් හට නේවාසික පහසුකම් සැපයීම සඳහා
# සුදුසු නිවාස කුලියට ගැනීම සඳහා අයදුම්පත

1. නිවස අයිතිකරු ගේ නම :

2. නිවස අයිතිකරුගේ ලිපිනය :

3. නිවස අයිතිකරුගේ දුරකථන අංකය : ස්ථාවර ........................................ ජංගම ..........................

4. කුලියට දීමට බලාපොරොත්තු වන නිවසේ ලිපිනය :

5. විශ්වවිද්‍යාලයට එම නිවසේ සිට ඇති දුර (Km):

6. නිවසේ වර්ග ප්‍රමාණය ($m^2$):

7. නිවස වෙත යාමට ඇති මාර්ගයේ පළල අඩි (ප්‍රධාන මාර්ගයට යාබද නොවේ නම්):

8. නිවසේ වහලය සඳහා සිවිලිම ගසා ඇත්ද යන වග :

9. වැසිකිළි ගණන :

10. නාන කාමර ගණන :

11. නිවස වටා ඇති වැට / තාප්පය පිළිබඳ විස්තර :

12. වෙනත් පහසුකම් :

ඉඩමේ ඔප්පුවේ සහතික කළ පිටපතක්, විශ්වවිද්‍යාලයේ සිට අදාළ ස්ථානයට පිවිසීමේ දළ සිතියමක්, අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කළ මේ සමග අමුණා ඇත.

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහාථ කරමි.

අයදුම්කරුගේ අත්සන - ..............................

දිනය - ..............................